සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

## ඉස්ලාම් II

※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) **ෆර්ලු කිෆායත්** හඳුන්වාදෙන ක්‍රියා **දෙකක්** සඳහන් කරන්න.
(ii) **සම්අල්ලාහු ලිමන් හමිදා** යන **ඉඃතිදාල්ට** පැමිණීමෙන් පසු පාරායනය කළ යුතු දුආ ඔබේ භාෂාවෙන් ලියන්න.
(iii) **සුජූද්** හි දී බිම ස්පර්ශ විය යුතු නළල සහ අත් දෙක හැර අනෙක් අංගයන් **හතර**, දෙක බැගින් සඳහන් කරන්න.
(iv) zසකාත් ලාභීන් අතර **ෆීසබීලිල්ලාහ්/ඉබ්නු සබීල්** යන අය වෙන්කොට දක්වන්න.
(v) හජ්වලට **නියියත්** තබන ක්‍රම අතුරෙන් **අල්-ඉෆ්රාද්** යන්නෙහි අර්ථය කුමක් ද?
(vi) විධිමත් **තලාක්** සඳහා ඇති කොන්දේසිවලින් **දෙකක්** සඳහන් කරන්න.
(vii) **ඉජාරා** සහ **සලම්** යන වෙළෙඳ ක්‍රම අතර වෙනස්කම් සඳහන් කරන්න.
(viii) කලීෆා අලි (රලි) තුමා විසින් ඉටුකරන ලද සේවාවන් **දෙකක්** සඳහන් කරන්න.
(ix) අරාබි ඉතිහාසඥයකු වූ **ඉබ්නු ෂහ්රයාර්** තුමා **අජාඉබුල් හින්දු** යන ග්‍රන්ථයේ ශ්‍රී ලංකාව ගැන සඳහන් කළ තොරතුරු කෙටියෙන් ලියන්න.
(x) ඉස්ලාම් ඉතිහාසයේ මිථ්‍යාදෘෂ්ටික චින්තන කණ්ඩායම් බිහිවීමට තුඩුදුන් කරුණු **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) ඉස්ලාම් තහනම් කර ඇති වෙළෙඳාම් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
(ii) **මුෂාරකා** වෙළෙඳාම් ක්‍රම ගැන කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) භාණ්ඩ ගනුදෙනු කිරීමේ දී පිළිපැදිය යුතු **ෂරීආ** සීමාවන් **පහක්** පැහැදිලි කරන්න.

**3.** (i) **දාරුල් ෆනා** යනු කුමක් ද?
(ii) **ඛත්මුන් නුබුව්වත්** යනු කුමක් ද? අල්-කුර්ආන් අල්-හදීස් මූලාශ්‍ර **එක** බැගින් ඉදිරිපත් කරන්න.
(iii) **සූරා ෆුර්කාන්හි** සඳහන් වන යහගුණාංග **පහක්** ලැයිස්තු ගතකොට විස්තර කරන්න.

**4.** (i) zසකාත්හි සමාජීය ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.
(ii) උපවාසයෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න.
(iii) සලාත්වල වැදගත්කම සඳහන් කොට, එමගින් ලැබෙන සමාජ ප්‍රතිලාභ **තුනක්** පැහැදිලි කරන්න.

**5.** (i) **ඉජ්තිහාද්** යනු කුමක් ද?
(ii) **ඉජ්මාහි** වර්ග **දෙකක්** සඳහන් කොට, ඒවායින් **එකක්** පැහැදිලි කරන්න.
(iii) **ෆික්හු** යනු කුමක් ද යන්න සඳහන් කොට, මද්හබ්වල ඉමාම්වරු **හතරදෙනා** කෙටියෙන් හඳුන්වා දෙන්න.

**6.** (i) කුරෙෂ්වරු නබිතුමාගේ **දාවා** වලට විරුද්ධ වීමට තුඩුදුන් හේතු **දෙකක්** ඉදිරිපත් කරන්න.
(ii) **සීරාව** ඉගෙන ගත යුතුය යන්නට හේතු ඉදිරිපත් කරන්න.
(iii) **සුන්නාහි** වැදගත්කම ගැන අල්-කුර්ආන්, අල්-හදීස් මූලාශ්‍ර සහිතව විස්තර කරන්න.

**7.** පහත සඳහන් ඒවායින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) එම්. සී. සිද්දිලෙබ්බේ විද්වතා
(ii) ශ්‍රී ලංකා පුරවැසියෙක් ලෙස මුස්ලිම්වරයකු පිළිපැදිය යුතු පිළිවෙත්
(iii) **අජ්නබිවරුන්** සමග සීමාවන් සුරැකීම
(iv) ජීවිතය වන්දනයකි

※※※

